# තනතුරු - ඇබෑර්තු

## තුම්පනේ ප්‍රාදේශීය සභාව - තනතුරු පුරප්පාඩු

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | විදුලි කාර්මික | 01 | රා.ප.ච. 3/2016 අනුව<br>පී.එල්. 2-2016<br>රු. 25,250 - 10x270 – 10x300 – 10x330 –12x350<br>රු. 38,450/- (මාසික) | දෙවරකට නොවැඩි වාර ගණන දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය.<br><br>ශිල්පීය නිපුණතා වශයෙන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.<br><br>*(අ)* වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ 2) හෝ 3 වන මට්ටමේ (NVQ 3) සහතිකය ලබා තිබීම.<br>*හෝ*<br>*(ආ)* කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම<br>*හෝ*<br>*(ඇ)* ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතිකය ලබා තිබීම.<br>*හෝ*<br><br>*(ඈ)* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම.<br><br>*හෝ*<br>*(ඉ)* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>*(ඊ)* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br><br>*පළපුරුද්ද :*<br><br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 2 ක් වත් විය යුතුය.) |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | සුදුසුකම් |
|---|---|---|---|---|
| 02 | ඖෂධ සංයෝජක | 01 | රා.ප.ච. 3/2016 අනුව පී.එල්. 2-2016<br>රු. 25,250 - 10x270 – 10x300 – 10x330 –12x350 – රු. 38,450 (මාසික) | දෙවරකටවත් නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය.<br>ශිල්පීය නිපුණතා වශයෙන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.<br>(අ) වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 02 වන මට්ටමේ (NVQ 2) හෝ 3 වන මට්ටමේ (NVQ 3) සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>*හෝ*<br>(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>(ඈ) ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාලව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>(ඊ) තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br>*පළපුරුද්ද*<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 02 ක් වත් විය යුතුය.) |
| 03 | කාර්යාල කාර්ය සහායක | 01 | රා.ප.ච. 3/2016 අනුව පී.එල්. 1-2016<br>රු. 24,250- 10x250 – 10x270 – 10x300 – 12x330 - රු. 36,410/- (මාසික) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයන් 05 ක් එක් වරක දී සමත්වී තිබීම. |
| 04 | පුස්තකාල සහායක | 01 | රා.ප.ච. 3/2016 අනුව පී.එල්. 1-2016<br>රු. 24,250 - 10x250 – 10x270 – 10x300 – 12x330 - රු. 36,410/- (මාසික) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයන් 05ක් එක් වරක දී සමත්වී තිබීම. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | සුදුසුකම් |
|---|---|---|---|---|
| 05 | මුරකරු | 01 | රාං.ප.ච. 3/2016 අනුව පී.එල්. 1-2016 රු. 24,250/- 10x250 – 10x270 – 10x300 – - 12x330 - රු. 36 ,410/- (මාසික) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත්වී තිබීම. |
| 06 | මාර්ග කම්කරු | 05 | රාං.ප.ච. 3/2016 අනුව පී.එල්. 1-2016 රු. 24,250/- 10x250 – 10x270 – 10x300 – - 12x330 - රු. 36,410/- (මාසික) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයන් 05 ක් එක් වරකදී සමත්වී තිබීම. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථා වලදී 5 ශ්‍රේණිය සමත් වීම අවම සුදුසුකම් ලෙස සැලකේ. |
| 07 | සෞඛ්‍ය කම්කරු | 02 | රාං.ප.ච. 3/2016 අනුව පී.එල්. 1-2016 රු. 24,250/- 10x250 – 10x270 – 10x300 – - 12x330 රු. 36,410/- (මාසික) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයන් 05 ක් එක් වරකදී සමත්වී තිබීම. ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොමැති අවස්ථාවල 5 ශ්‍රේණිය සමත් වීම අවම සුදුසුකම් ලෙස සැලකේ. |

*02. බඳවා ගැනීමේ ක්‍රමය*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව පවතින පුරප්පාඩුවලට පත් කරනු ලැබේ. බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. මෙහිදී පළාත් පාලන ආයතනයේ සේවයේ නියුතු අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබාදේ.

පොදු සුදුසුකම්

01. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර වසර 03 කට නොඅඩු කාලයක් තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු බව තහවුරු කළ යුතු ය.
03. යහපත් චරිතයකින් හෝ මනා සෞඛ්‍යකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට යටත් විය යුතුය.
04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.
05. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපායි.
06. ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී අඩුවම් ලැබූවෙකු නොවිය යුතුය.
07. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීම නිවේදනයේ සඳහන් දිනට හෝ එදිනට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
08. ඉහත සඳහන් සියලුම තනතුරු සඳහා බඳවා ගැනීම තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

02. බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂක කාල සීමාවකට යටත් වේ.

03. මෙම බඳවා ගැනීමේ දී කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට, පළාත් සභාවේ මූල්‍ය රීතිවලට රජයේ මුදල් රෙගුලාසිවලට, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හෝ රෙගුලාසිවලට ද පළාත් පාලන ආයතනයට අදාළ පනත්/පනත්වල විධිවිධානවලටද තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් වරින්වරට නිකුත් කරන ලද/ලබන නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.

04. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික ශිල්පීය (නොවන) අර්ධ ශිල්පීය හා ශිල්පීය සේවක සේවා ව්‍යවස්ථාවේ කොන්දේසි අදාළ වේ.

*04. ඉල්ලුම් කළ යුතු ආකාරය*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය අනුව 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත අයදුම්පත් භාරගන්නා අවසන් දින වන 2018.10.22 දිනට පෙර ලේකම්, තුම්පනේ ප්‍රාදේශීය සභාව, ගලගෙදර යන ලිපිනයනට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම *ගැසට්* නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය :

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන සහතික
iii. පදිංචිය සහතික කිරීම පිණිස මෑතක දී ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුයි.)
iv. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්
v. පළපුරුද්ද පිළිබඳ සහතික
vi. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ පිටපතක්.

ඩී.පී.එම්.බී. රණසිංහ,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2018 සැප්තැම්බර් මස 14 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර**

**........................................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :————————. මහතා/ මහත්මිය/මෙනවිය.

02. මුලකුරු වලින් හැඳින්වෙන නම (පැහැදිලි අකුරින්) :————————.

03. ස්ථිර ලිපිනය :————————.

04. දුරකථන අංකය : ජංගම: ————————. නිවස: ————————.

05. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

06. ජාතික හැඳුනුම්පත් අංකය :————————

07. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට
වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

08. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.

09. විවාහක/අවිවාහක බව : ————————.

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග : ————.

11. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තරය :

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

12. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

13. ඔබ දැනටමත් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්,

(i) දැනට දරන තනතුර :————————.

(ii) එම තනතුරට පත් වූ දිනය :————————.

(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ව්‍යාපෘති පදනම මත ද?) :————————.

මෙම අයදුම්පතේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් අනාවරණය වුවහොත් සේවයෙන් පහකරනු ලැබීමටත් යටත් වන බවත් ප්‍රකාශ කරමි.

දිනය : ————————. අයදුම්කරුගේ අත්සන : ————————.

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු/ ඉල්ලුම්කාරිය වන ..........................................................මහතා / මහත්මිය / මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු ඇය කුමන ආකාරයෙන් හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————

දිනය : ————————. ආයතන ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව